Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

# වෘත්තීය ක්ලමථ තත්ත්වය ඇඟලුම් කර්මාන්තවල සේවකයින්ගේ ඵලදායිතාව කෙරෙහි බලපාන ආකාරය (වතුපිටිවල ආයෝජන ප්‍රවර්ධන කලාපය ඇසුරින් )

**ආර්.ඒ මධුභාෂිනී** [1]

**ජී.ඩබ්. ඉන්ද්‍රානී** [2]

**සංක්ෂේපය**

තරගකාරීත්වයෙන් යුතු කාර්මීකරණ ලෝකයේ සේවකයින්ගේ ඵලදායිතාව ඇඟලුම් කර්මාන්තවල පැවැත්ම කෙරෙහි අත්‍යවශ්‍ය දෙයක් බවට පත් වේ . ඇඟලුම් කර්මාන්තවල වැඩ පරිසරය තුළ ඇති වෘත්තීය ක්ලමථ තත්ත්වය සේවක ඵලදායිතාව කෙරෙහි බලපෑම් කරන සුලබ සංසිද්ධියක් බවට පත්ව තිබේ. ඒ අනුව වෘත්තීය ක්ලමථ තත්ත්වය ආයතනයක ඵලදායිතාව කෙරෙහි කුමන බලපෑමක් කරයි ද යන්න සොයා බැලීම මෙම විශ්ලේෂණයේ ප්‍රධාන අරමුණ බවට පත්ව තිබේ.

මෙම අධ්‍යයනය සිදු කිරීම සඳහා වතුපිටිවල ආයෝජන ප්‍රවර්ධන කලාපයේ එච්ඩන්ස් ටයිමෙක්ස් ආයතනයේ සේවකයින් සඳහා ලබා දෙන ප්‍රශ්නාවලියක් හා සම්මුඛ සාකච්ඡා මගින් දත්ත ලබා ගන්නා ලදී. සමීක්ෂණය සඳහා සරල සසම්භාවී ක්‍රමය මත සේවකයින් 60ක නියැදියක් තෝරා ගනිමින් සරල ප්‍රතිපායන ක්‍රමය මඟින් දත්ත විශ්ලේෂණය කර ඇත.

මෙහි අධ්‍යයන ප්‍රතිඵලය ලෙස වෘත්තීය ක්ලමථ තත්ත්වය සහ ශ්‍රම ඵලදායිතාවය අතර සෘණාත්මක සම්බන්ධතාවක් පෙන්නුම් කරන ලදී. මෙම අධ්‍යයන සමීක්ෂණයට අනුව ඇඟලුම් කර්මාන්තවල සේවකයින්ගේ වෘත්තීය ක්ලමථ තත්ත්වය කෙරෙහි සහ - සේවකයින්ගේ හැසිරීම (co-worker’s behavior), ආයතනික වැඩ පරිසරය, වැඩ බහුලත්වය, රැකියා පීඩනය , අධීක්ෂකවරුන්ගේ බලපෑම ආදිය සෘජුව බලපාන බව හඳුනා ගත හැකි විය. එමෙන්ම වෘත්තීය ක්ලමථ තත්ත්වය නිසා සේවකයින්ගේ කාර්යයන් නිසි අයුරින් සිදු කිරීමට නොහැකි වීමත් , ආයතනයේ සේවකයින් දිගු කලක් සේවයේ රැඳී නොසිටීමත් හේතු කොට ගෙන ආයතනය අපේක්ෂා කරන ඉලක්ක කරා ගමන් කිරීමට නොහැකි වී ඇති බව ද හඳුනා ගත හැකි විය. මෙම තත්ත්වයන් මත ආයතනය තුළ මිත්‍රශීලී පරිසරයක් ගොඩ නැඟීමටත් , ආයතනය තුළ පවතින කළමනාකාරීත්ව දුර්වලතා මඟ හරවා නිවැරදි කළමනාකරණ ප්‍රතිපත්ති අනුගමනය කිරීමටත්, ආයතනය තුළට පැමිණෙන නව සේවකයින් සඳහා අනුස්ථාපන වැඩසටහන් (orientation programme) ක්‍රියාත්මක කිරීමටත් පියවර ගැනීම වැදගත් වේ.

මුඛ්‍ය පද : - වෘත්තීය ක්ලමථ තත්ත්වය , ශ්‍රම ඵලදායිතාව

---

*1. ආර්ථික විද්‍යාව, ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*

*2. මහාචාර්ය, ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*